


# "මගෙ දුවේ නුඹ අවදියෙන් නම් -----"



සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ කවිය මෙන්ම ගීතය ද අද ප්‍රබල ස්ථානයක් හිමි කරගෙන ඇත. කවිය හා ගීතය අතර ඇති සමාන අසමානකම් පිළිබඳව ද නුදුරු අතීතයේදී විවිධ මත පළ විය. කෙසේ නමුදු මෙම සාහිත්‍ය අංග දෙකෙහිම මුඛ්‍ය පරමාර්ථයක් නම් රස දැනවීමයි. "කාව්‍යං රසාත්මකං වාක්‍යං" යනුවෙන් විශ්වනාථ, පළ කළ අදහස අදත් අප අතර වඩාත් ප්‍රචලිත වූවකි. මෙහිදී 'කාව්‍ය' යන්නෙන් වඩා පුළුල් අරුතක් පළ කරයි. එනම්, 'සාහිත්‍යය' යන්න මෙයින් පොදුවේ හැඟවෙන අරුතයි. කෙසේ නමුදු, කවිය යන්නට තවත් විවිධාකාරයෙන් අර්ථ දැක්වූ විද්වත්හු බොහෝ වෙති. "කවිය යනු, ස්මරණීය වාගාලාපයයි" යනුවෙන් ඩබ්ලිව්. එච්. ඕඩින් අරුත් දැක්වීමේදී හැඟෙන්නේ ද කවිය මගින් අපට සිහියේ තබාගත හැකි අර්ථවත් වචන මාලා, යෙදුම් ආදිය පළ වන බවයි. කෙසේ නමුදු කවියක ශබ්දය මෙන්ම අර්ථය ද එකසේ වැදගත් වන බවට, රුද්‍රට නම් පඬිවරයා පළ කළ අදහස ගැළපෙයි. ඔහු දැක්වූ පරිදි, " එක්තැන් වූ ශබ්දය හා අර්ථය කාව්‍ය" බව කිව හැකිය. විශ්වනාථගේ, 'රසය ආත්ම කොටගත් වාක්‍යය කාව්‍යයයි' යන කියමන මේ දැක්වූ සියලු අදහස් තවතවත් ඉස්මතු කර ලයි.

කවිය පිළිබඳ දක්වා ඇති මේ සියලු කරුණු ගීතයට ද බොහෝ දුරට ගැළපේ. ගීතයක ඇති විශේෂත්වය ලෙස එහි සුගායනීය බව සැලකිය හැකිය. එපමණක් නොව, කවියක් රචනා කිරීමෙන් එහි නිර්මාණ කාර්යය සම්පූර්ණ වන අතර ගීතයක් පිළිබඳ තත්වය ඊට වෙනස්ය. ගීතයක් අවසන් වශයෙන් සම්පූර්ණ නිර්මාණයක් බවට පත් වීම සඳහා පද රචනය, සංගීතය හා ගායනය යන ප්‍රධාන අංග තුන සම්පූර්ණ විය යුතුය. අවසන් නිර්මාණය ලෙස ගීතයක් ගායකයකුගේ හෝ ගායිකාවකගේ මුවින් ගැයුණු පසුව ඒ පිළිබඳ පූර්ණ රස වින්දනයකට රසිකයාට අවකාශ ලැබෙනු ඇත. කවිය හා ගීතය රචනා කිරීමේදී ද යම් යම් වෙනස්කම් තිබිය හැකිය. පද්‍ය, නැතහොත් කවි රචනයකට වඩා ගීත රචනය තරමක් දුෂ්කර කටයුත්තක් යයි කීම නිවැරදිය. මෙයින් හැඟෙනුයේ පද්‍ය රචනය පහසු කාර්යයක්ය යන්න නොවේ. පද්‍ය රචකයාට වඩා යම් යම් සීමා මායිම් ගීත රචකයකු ඉදිරියේ පවතී. කවිය යයි කී විට කෙටි කවි, දීර්ඝ කාව්‍ය මෙන්ම කාව්‍ය ග්‍රන්ථ ද ඊට ඇතුළත් වේ. එහෙත් ගීතයක් යනු කෙටි නිර්මාණයකි. එබැවින් ඒ සඳහා රචකයා සුපරීක්ෂාකාරීව, තම ප්‍රතිභාව මෙහෙයවමින් සීමිත ඉඩකඩ තුළ උචිත පද මාලාවක් තෝරාගත යුතු වෙයි. යොදාගත හැකි වචන සංඛ්‍යාවේ සීමිත බව මෙම කාර්යය තවත් දුෂ්කර කරවයි.

ගීතයක් රචනා කිරීම සඳහා ගීත රචකයකුගේ සිත තුළ පිබිදී එන ගී සංකල්පනාව එහිදී වඩාත් පෙෂණය වෙමින්, වර්ධනය වෙමින් අවුත් වචනවලට හැරවෙයි. එමෙන්ම ඔහු තම නිර්මාණය සඳහා යොදාගන්නා වචනවල මුදුමොළොක් ස්වභාවය ගැන ද අවධානය යොමු කළ යුතු වෙයි. එක් අතකට බලන විට ශබ්ද රසයෙන් අනූන, නැතහොත් අර්ථය අභිභවා ශබ්දය මතු වනසේ රචනා වන ගීතයක අන්තර්ගත වචන තරමක් වෙනස් ස්වරූපයක් ගත හැකිය. එසේ වුවද, මනහර ගායනයක් ලෙස ගායකයකුගේ හෝ ගායිකාවකගේ මුවෙන් ගැයෙන නිර්මාණයක ඇතුළත් වන පදවල සැබවින්ම සුලලිත බවක්, සුගායනීය බවක්, මනහර බවක් තිබිය යුතු වෙයි. උචිත තනුවක් යොදා ගැයීමට හැකි වන පරිද්දෙන් පද ගළපාගැනීම ද ගීත රචනයේදී අත්‍යවශ්‍ය වූවකි.

සාර්ථක ගීත නිර්මාණයක් බිහි වීමට නම් ගීත රචකයා යොදාගත් පද මාලාවත් සංගීතඥයා ඊට සපයන තනුව සහිත සංගීතයත් එකිනෙකට ගැළපිය යුතුය. අවසානයේදී පදමාලාවෙන් මතු විය යුතු ගී සංකල්පනාව, එහි මුඛ්‍ය අරුත, ගීතය ගායනයේදී රසිකයාට දැනිය යුතුය. ගීතයක්, අවසානයේදී අංග සම්පූර්ණ නිර්මාණයක් බවට පත් වීමට අවශ්‍ය වන බොහෝ කරුණු අතර එහි පද, එමගින් ධ්වනිත වන අර්ථය, ගීතයෙන් මතු වන රසභාව, යෝග්‍ය ලෙස සිදු වන ගායනය හා වාදනයෙහි සංකලනය යන මේ කරුණු විශේෂත්වයක් හිමි කරගනියි. ගීතයක් ශ්‍රවණය කරන රසිකයාගේ මනස තුළ ආනන්දය, රසය මෙන්ම කිසියම් ආකාරයක බුද්ධි වර්ධනයක් ද සිදු විය යුතුය. ගීතයක ඇතුළත් වන අරුත්වලින් මෙන්ම

ගායනයේදී මතු වන ශබ්ද ධ්වනියෙන් ද, රිද්මයෙන් ද සහෘදයාට එකී ප්‍රයෝජන අත් කරගත හැකි විය යුතුය. අන් කවර සාහිත්‍ය නිර්මාණයකින් මෙන්ම සාර්ථක ගීතයකින් ද සහෘදයා විඳගන්නා රසය, නිර්මල වූවකි. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පවසන පරිදි,

"රස වින්දනය වූ කලී නිර්මල ආස්වාදයකි. එය අන් සියලුම වෙද්‍යයන්ගෙන් (වේදිතයන්ගෙන්) තොර වූවකි ------" (කල්පනා ලෝකය, 37 පිට)
මෙලෙසින් ගත් කල හොඳ ගීත රචකයකු අතින් ලියවෙන සුන්දර නිර්මාණයක්, මිහිරි හා යෝග්‍ය ස්වර රටාවකින් හෙබි සංගීතයකින් ඔපවත්ව ගැයෙන විට ශ්‍රාවකයාගේ සිත් තුළ එම නිර්මල ආස්වාදය දැනවෙයි. සරච්චන්ද්‍ර මහතා පවසන පරිදි එවන් මොහොතක දැනෙන එම වින්දනය අන් සියලු වින්දනයන්ගෙන් වෙනස් වූ හා විශේෂ වූ විඳගැනීමකි.

ශ්‍රී ලංකාව තුළ නූතන ගීත සාහිත්‍යය, විශේෂයෙන්ම සිංහල ගීතය එක්තරා විදියක ඉහළට නැගීමකට වඩා පරිහානි තත්වයක් දෙසට ඇදී යාමක් ගැන නිරන්තරයෙන් අසන්නට ලැබේ. මෙම චෝදනාවෙහි කිසියම් සත්‍යයක් නැතුවා නොවේ. හුදෙක් බොළඳ වචන මාලාවකින් හා කඨෝර සංගීතයකින් සමන්විත ඇතැම් ගීත ශ්‍රවණය වන විට උක්ත අදහස බොහෝ දුරට සත්‍යයක් බව පෙනේ. එසේ වුවද, තිරිවානා ගල් කැට අතරින් මතු වී දිදුළන මැණික් කැට මෙන් අතිශය සුන්දර, අර්ථවත්, මිහිරි ගීත කොතෙකුත් අද අපට අසන්නට ලැබීම වාසනාවකි. එවන් අගනා ගීත අතර දිදුළන ගී මිණක් ලෙස නම් කළ හැකි සුභාවිත ගීතයකි. සුප්‍රකට ගීත රචක රත්න ශ්‍රී විජේසිංහ අතින් ලියවුණ "මගෙ දුවේ නුඹ අවදියෙන් නම් -----" යන අගනා නිර්මාණය. මෙහි ඇතුළත් අර්ථවත් ගී සංකල්පනා හා සැසඳෙන පරිද්දෙන් මෙම නිර්මාණ කරුවා සිය ප්‍රතිභාව මතු වී පෙනෙන සේ පෑන හසුරුවා ඇත.

"මගෙ දුවේ ඔබ අවදියෙන් නම් - මේ රැයේ
මිහිරිම වෙලාවයි
දොර ඇරන් එළියට ආවොතින් - මේ මිහිරි
දේවල් නුඹටමයි
සේපාලිකා මල් බිමට බැහැලා - ඇවිදින්න යන
වෙලාවයි
නිල් තාරකා බිම බලාගෙන - වැව් දියට පෙම්
බැඳිවෙලාවයි------"

කවියක හෝ ගීතයක රචකයා යොදාගන්නා පදවැල් හුදෙක් වාච්‍යාර්ථයම පමණක් මතු කිරීමක් අපේක්ෂා නොකෙරේ. ගීතයක යෙදෙන වචනවලින් වෙන් වෙන්ව මෙන්ම වචන සංයෝජනයේදී ද ඉස්මතු වන, නැතහොත් ධ්වනිත වන අරුත් වඩාත් වැදගත් වෙයි. ගීත රචකයාගේ මනසේ ඇඳෙන ගී සංකල්පනාව සහිත චිත්ත රූප එම පදවැල මගින් සහෘදයා ඉදිරියේ මැවී පෙනේ නම් එය සාර්ථක නිර්මාණයක් වනු ඇත.

රත්න ශ්‍රී විජේසිංහ නමැති ප්‍රතිභාපූර්ණ නිර්මාණ කරුවා මෙහිදී පෞද්ගලිකව තම දියණිය අමතා කියන දෙයකට වඩා සියලු පියවරුන් තම දියණියන්ට, එපමණක් නොව ලෝකයේ සියලුම දූ රුවන් අමතා පවසන වැදගත් අදහස් සමුදායක් ගීතයට නැගීමක් සිදු කර ඇත. රාත්‍රි කාලයේදී සුවසේ නිදා සිටින දියණිය, ඒ අතරතුර ඇහැරී සිටින මොහොතක් නම්, මේ රාත්‍රියේ මිහිරිතම හෝරාව මෙය බව කියමින් ඇයට ලෝකය පිළිබඳව, සොබාදහම හා එහි සොඳුරු බව පිළිබඳව මතක් කර දීමක් කරන ආකාරයෙන් මුල් පද කිහිපය ගළපාගෙන තිබෙන අයුරු පෙනේ.

මෙලොව ජීවත් වන මිනිසුන්, ගැහැනුන්, දරුවන් යන හැම කෙනෙක්ම මෙම පෘථිවි තලයේ ඇති සියලු දේවල සුන්දරත්වය විඳගැනීමට වාසනාව ලබා ඇති අය බව සැබෑවකි. එසේ වුවද සමාජය තුළ සිදු වන විවිධාකාර අයහපත් ක්‍රියා මෙන්ම මිනිසුන්ගේ සිත්වල පවත්නා විෂම සිතුවිලි නිසා හැම කෙනකුටම නිදහසේ එම අයිතිය භුක්ති විඳීමට අවකාශ නැත. කෙසේ වුවද සොබා දහම කවදාටත් තම සුන්දරත්වය දසත පතුරුවමින් ලෝකයාට සතුට, සැනසුම ලබා දීමට සැදී පැහැදී සිටී. එය සියැසින් දැකගැනීමට නම් තමතමන් කොටු වී සිටින ස්ථානවල දොර ජනෙල් ඇරගෙන පිටතට පැමිණිය යුතුයි. පිටත ඇති ස්වභාව සෞන්දර්යය නැරඹිය යුතුයි. මෙම ගීත රචකයා, එක් අතකින් බලන විට මෙහිදී අදහස් කරනුයේ වත්මන් දරු පරපුරට ඒ සඳහා අවස්ථාවක් නොමැති බව විය හැකිය. වර්තමාන අධ්‍යාපන ක්‍රමය හුදෙක් තරඟයක් වී ඇති නිසා ළමා ළපටි හැමදෙනාම පාහේ ඒ තුළ සිරගත වෙමින් සැබෑ නිදහස භුක්ති විඳීමේ වාසනාව අහිමි කරගෙන ඇත.

ඇමෙරිකාවේ දහසය වන ජනාධිපති, ඒබ්‍රහම් ලින්කන් මහතා තම පුතාගේ ගුරුතුමාට යැවූ ලිපියෙන් ඉල්ලා සිටිනුයේ තම දරුවාට පන්ති කාමරයෙන් බැහැරව අවට ලෝකයේ සුන්දරත්වය විඳගැනීමට ද කියා දෙන ලෙසය. සමාජය තුළ පවත්නේ දහමම නොව අදහම ද එහි ඇති බව තම දරුවාට කියා දෙන්නැයි ඒබ්‍රහම් ලින්කන් මහතා සිය පුත්‍රයාගේ ගුරුතුමාට අපහසු විධානයක් නැතහොත් ඉල්ලීමක් කරයි. එදා ඇමෙරිකානු සමාජයේ පැවති තත්වය වර්තමාන විශ්ව සමාජය තුළම දැකගත හැක්කේ මුළු ලෝකයාම තරඟකාරී ලෙස, හැල්මේ දුවන මිනිසුන් කොට්ඨාසයක් වීම නිසයි. නූතන ශ්‍රී ලාංකික සමාජය දෙස බැලුවද, ළමා ජීවිත සැබෑ ලෙසින් ගත කරන්නට අපේ දරුවන්ට තිබිය යුතු ඉඩකඩ ඇහිරී යමින් පවත්නා ආකාරය කවියන්ගේ, ගීත රචකයන්ගේ, පොදුවේ සෑම නිර්මාණ කරුවකුගේම අවධානයට ලක් වී ඇති අතර, රත්න ශ්‍රී විජේසිංහ වැනි අපූරු නිර්මාණ කරුවාගේ පෑන් තුඩින් රචිත උක්ත ගීතයෙන් ධ්වනිතාර්ථ නංවමින් කියවෙන්නේ ද එවන් පණිවුඩයකි.

"මගෙ දුවේ නුඹ අවදියෙන් නම් මේ රැයේ මිහිරිම වෙලාවයි" යනුවෙන් ආදරණීය පියකු තම දියණියට කියා සිටින්නේ මෙලොව ඇති සැබෑ සුන්දරත්වය රිසි සේ විඳ ගැන්මට ඉඩ